Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023 මැයි 3, කොළඹ

## නෙස්ලේ ලංකා සමාගම, ශ්‍රී ලංකාව කෙරෙහි සිය දායකත්වය තවදුරටත් ඉහළ නංවයි

*කොළඹ කොටස් වෙළෙඳපොළෙන් ඉවත් වීමට යෝජනා කරයි*

වසර 115කට අධික කාලයක් පුරාවට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමාගමක් වශයෙන්, නෙස්ලේ ලංකා සමාගම, ශ්‍රී ලංකාව සහ එහි ජනතාව සමඟ ඉතා ශක්තිමත් බැඳීමකින් සහ කැපවීමකින් යුතුව කටයුතු කරයි. මෙම ගමන් මගෙහි, 'යහපත් ආහාර, යහපත් දිවිය' ('Good food, Good life') යන තේමාව යටතේ ක්‍රියාකරන නෙස්ලේ ලංකා සමාගම, තම පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කරමින් ලාංකික පවුල් සහ ප්‍රජාවන්ට මෙන්ම, මිහිකතට ද ධනාත්මක බලපෑමක් ඇති කිරීමට පියවර ගෙන ඇත. එමෙන්ම, සමාගමෙහි ආයෝජන තව දුරටත් පුළුල් කරමින් 2022 වසරේ කුරුණෑගල පිහිටි සිය කර්මාන්තශාලාවේ නිෂ්පාදන ධාරිතාව වර්ධනය කළ අතර, 2023 වසරේ එහි ජෛවස්කන්ධ (biomass) බොයිලේරුවක් ස්ථාපිත කිරීමට ද පියවර ගත්තේය.

දහස් සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයින්ගේ ජීවනෝපාය සංවර්ධනයට දායක වන නෙස්ලේ ලංකා සමාගම, 24,000කට අධික ශ්‍රී ලාංකික කිරි ගොවීන් සහ පොල් වගාකරුවන් මෙන්ම ගෙවතු වගාකරුවන්ට ද සහාය වෙයි. එමෙන්ම, සමාගමේ 800 ඉක්මවන සෘජු රැකියා නියුක්තිකයිට වෘත්තීය වර්ධනය මෙන්ම ජාත්‍යන්තර පුහුණුවීම් සහ සංවර්ධන වැඩසටහන් සඳහා අවස්ථා ද සපයයි.

ශ්‍රී ලංකාව කෙරෙහි තම දායකත්වය තවදුරටත් ඉහළ නැංවීම සඳහා, සිය කාර්යක්ෂමතා වැඩි කිරීමට සමාගම නිරන්තරයෙන් පියවර ගනියි. ඒ අනුව, අවශ්‍ය අනුමැතියට යටත්ව, නෙස්ලේ ලංකා සමාගම, කොළඹ කොටස් වෙළෙඳපොළෙන් ඉවත් වීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ. මෙය, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත වාර්තාකරණ සහ අනුකූලතා අවශ්‍යතාවලට අනුගත වෙමින්, සිය ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සමාගමට උපකාර වනු ඇත.

"අපගේ කොටස් හිමියන් අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසයට සහ වසර ගණනාවක් පුරා ලබා දුන් නිරන්තර සහයෝගයට අපි ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමු. මෙම යෝජනාව අපගේ කොටස් හිමියන්ගේ යහපතට හේතු වන බව අපි තරයේ විශ්වාස කරන අතර ඔවුන්ට ආකර්ෂණීය සහ සාධාරන ප්‍රතිලාභයක් පිරිනමන බවට සහතික වෙමු. අතීතයේ දී මෙන්, අපි දිගටම ප්‍රජාවන් සමඟ කටයුතු කරමින්, අපගේ ලාංකික පාරිභෝගිකයින්ට උසස් තත්ත්වයේ නිෂ්පාදන පිරිනමමින්, මිහිකතට ද යහපතක් කිරීමට කැපවී සිටින්නෙමු. අපගේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය තව දුරටත් ඉහළ නංවමින්, ශ්‍රී ලංකාවටත් සහ එහි ජනතාවටත් අපගේ පොරොන්දුව ඉටු කිරීම

කෙරෙහි අපි කැපවී සිටින්නෙමු" යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂ, බර්නාඩ් ස්ටෙෆාන් මහතා පැවසුවේය.

'වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ඉහළ ගුණාත්මකබවින් යුතු සිය ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත. 1906 වසරේ පටන් ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් සිදුකරන නෙස්ලේ ලංකා සමාගම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට බද්ධ වී ඇත. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් කර්මාන්තශාලාවේ දැඩි සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි.

---


| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |
| Corp. Communications | Isuri Alahakoon | +94760395781 | Isuri.Alahakoon@lk.nestle.com |